# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2023 මාර්තු 31 |


# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2023 පෙබරවාරි

## සුවිශේෂී කරුණු

- 2023 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන ආදායමෙහි අඩු වීමට සාපේක්ෂව ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳ හිඟයෙහි සැලකිය යුතු පහළ යෑමක් වාර්තා විය.
- 2023 වසරේ පෙබරවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සංචාරක ඉපැයීම් අඛණ්ඩව වර්ධනය විය.
- මෑත මාසවලට සාපේක්ෂව 2023 වසරේ පෙබරවාරි මාසය තුළ දී දළ නිල සංචිත තවදුරටත් ශක්තිමත් විය.
- විනිමය අනුපාතිකය තීරණය කිරීමේ දී ඉහළ නම්‍යශීලීභාවයකට ඉඩ හැරීමෙන් පසුව 2023 වසරේ මාර්තු මාසයේ දී විනිමය අනුපාතය සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය විය.
- 2023 වසරේ පෙබරවාරි මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ විදේශ ආයෝජනයන්හි ශුද්ධ ලැබීම් වාර්තා කළේය.
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ එ.ජ.ඩො. බිලියන 3ක විස්තීර්ණ ණය පහසුකම අනුමත වූ අතර එහි පළමු වාරිකය 2023 වසරේ මාර්තු මාසයේ දී ලබා දෙන ලදී.

## වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය

### අපනයන









| වෙළඳ හිඟය (එ.ජ. ඩො.බිලි.) | පෙබ. | ජන. - පෙබ. |
|---|---|---|
| 2022 | 0.8 | 1.6 |
| 2023 | 0.04 | 0.4 |

### ආනයන





### සංචාරක ඉපැයීම්


2023 පෙබ. : එ.ජ.ඩො. මිලියන 170
2022 පෙබ. : එ.ජ.ඩො. මිලියන 169
0.3% (වාර්ෂික වර්ධනය)




### විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ (එ.ජ.ඩො. මිලියන )





### දළ නිල සංචිත*





* චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වේ.


### කොළඹ කොටස් වෙළඳපොළ වෙත ශුද්ධ ලැබීම් (ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ - ශුද්ධ)




### රජය වෙත දළ විදේශ විනිමය ලැබීම්





### විනිමය අනුපාතිකයේ වෙනස්වීම් (එ.ජ. ඩොලරයට රුපියල්)



## වෙළඳ භාණ්ඩ ගිණුමේ ශේෂය


වෙළඳ ගිණුමේ හිඟය, සමස්ත ඉල්ලුම් තත්ත්වයන්ගේ අඩු වීම හේතුවෙන් ආනයන වියදමෙහි සැලකිය යුතු පහළ යෑමේ බලපෑම ප්‍රධාන වශයෙන් නිරූපණය කරමින්, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 780 සිට 2023 වසරේ පෙබරවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 39ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ ගියේය. 2023 වසරේ ජනවාරි - පෙබරවාරි කාලපරිච්ඡේදය තුළ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය, එ.ජ. ඩොලර් මිලියන 449ක් වූ අතර, එය 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,636ට සාපේක්ෂව කැපී පෙනෙන පහළ යෑමක් විය. මේ සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.

**රූප සටහන 1: 2023 වසරේ ජනවාරි - පෙබරවාරි කාලපරිච්ඡේදය තුළ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වෙළඳ හිඟය වෙනස් වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම** (එ.ජ. ඩොලර් මිලියන)




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ ශේෂය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**සමස්ත අපනයන: 2023 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව සුළු වර්ධනයක් වාර්තා කළද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2023 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, එ. ජ. ඩොලර් මිලියන 982ක් දක්වා සියයට 10.2කින් පහළ ගියේය.** අපනයන ආදායම අඛණ්ඩව දෙවන මාසයටත් එ.ජ. ඩොලර් බිලියනයට වඩා අඩුවෙන් වාර්තා විය. සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩ තුළ ආදායමේ පහළ යෑම් නිරීක්ෂණය වූ අතර, කාර්මික අපනයන සමස්ත පහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක විය. 2023 වසරේ ජනවාරි - පෙබරවාරි කාලපරිච්ඡේදය තුළ සමස්ත අපනයන ආදායම පසුගිය වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 10.7කින් පහළ ගියේය.

**කාර්මික අපනයන:** ඇඟලුම් අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහළ යෑමත් සමඟ 2023 වසරේ පෙබරවාරි මාසයේ දී කාර්මික භාණ්ඩ අපනයන ආදායම, 2022 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව පහළ ගියේය. ගෝලීය වශයෙන් අහිතකර ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ඇඟලුම් අපනයනය කරන ප්‍රධාන වෙළඳපොළවල ඉල්ලුම පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ගෘහස්ථ රබර් අත්වැසුම් අපනයනය අඩු වීම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම අඛණ්ඩව පහළ ගියේය. එසේම, ගුවන් යානා සඳහා යොදා ගනු


[1] අපනයන සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වන සංස්කරණය පදනම් කර ගත් අපනයන සංයුතිය, පිළිවෙළින්, ඇමුණුම II සහ ඇමුණුම IIIහි දක්වා ඇත.

ලබන ඉන්ධන සඳහා වන මිල ගණන් ඉහළ ගියද, ගුවන් යානා සහ නැව් සඳහා යොදා ගන්නා ඉන්ධන පරිමා පහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ද පහළ ගියේය. ඊට ප්‍රතිවිරුද්ධව, යන්ත්‍රෝපකරණ සහ යාන්ත්‍රික උපකරණ (ප්‍රධාන වශයෙන්, ඉලෙක්ට්‍රොනික උපකරණ) සහ මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ අපනයන ආදායම 2023 වසරේ පෙබරවාරි මාසයේ දී ඉහළ ගියේය.

**කෘෂිකාර්මික අපනයන:** 2023 වසරේ පෙබරවාරි මාසයේ දී කුළුබඩු සහ තේ අපනයන ආදායම ඉහළ ගියද, පොල් ආශ්‍රිත නිෂ්පාදිතවලින් (ප්‍රධාන වශයෙන්, පොල් කෙඳි සහ දිසිදි පොල්) ලද අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික භාණ්ඩ අපනයන ආදායම වසරකට පෙර පැවති අගයට සාපේක්ෂව සුළු වශයෙන් පහළ ගියේය. කරාබු නැටි; කුරුඳු; සහ සාදික්කා හා වසාවාසි අපනයන පරිමා වැඩි වීම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම ඉහළ ගියේය. තේ අපනයන පරිමා පහළ යෑමක් වාර්තා කළ ද තේ අපනයන මිල ගණන් ඉහළ යෑම තේ අපනයන ආදායම ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය.


**ඛනිජමය අපනයන:** ප්‍රධාන වශයෙන් ටයිටේනියම් ලෝපස් අපනයන ආදායම පහළ යෑම හේතුවෙන් 2023 පෙබරවාරි මාසයේ දී ඛනිජ අපනයන ආදායම, 2022 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව පහළ ගියේය.

**රූප සටහන 3: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 4: අපනයන සංයුතිය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[2]

**සමස්ත ආනයන: 2020 වසරේ මැයි මාසයෙන් පසු අඩුම ආනයන වියදම වාර්තා කරමින්, 2023 වසරේ පෙබරවාරි මාසයේ වෙළඳ භාණ්ඩ ආනයන වියදම, එ.ජ. ඩොලර් මිලියන 1,021 දක්වා 2022 වසරේ පෙබරවාරි මාසයේ ආනයන වියදමට සාපේක්ෂව අඩකින් පමණ පහළ ගියේය**. සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩ පහළ ගිය අතර, අන්තර් භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය. මේ අතර, 2023 වසරේ ජනවාරි - පෙබරවාරි කාලපරිච්ඡේදය තුළ සමස්ත ආනයන වියදම ද 2022 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 37.1කින් පහළ ගියේය.


[2] ආනයන සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය සිව්වන සංස්කරණය පදනම් කර ගත් ආනයන සංයුතිය, පිළිවෙළින්, ඇමුණුම IV සහ ඇමුණුම V හි දක්වා ඇත.

**පාරිභෝගික භාණ්ඩ:** 2023 වසරේ පෙබරවාරි මාසයේ දී ආහාර සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙඅංශයෙහිම ආනයන වියදම අඩු වීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා වූ වියදම 2022 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව පහළ ගියේය. සමස්තයක් ලෙස ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ ගිය අතර, ගෘහ උපකරණ; ගෘහ හා දැව භාණ්ඩ; සහ රෙදිපිළි හා උපාංග ඒ අතරින් කැපී පෙනුණි. ධාන්‍ය සහ ඇඹරුම් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, සහල්) ආනයන අඩු වීම හේතුවෙන් 2022 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව ආහාර සහ පාන වර්ග සඳහා වන ආනයන වියදම ද පහළ ගියේය.

**අන්තර් භාණ්ඩ:** 2023 වසරේ පෙබරවාරි මාසයේ දී ඉන්ධන සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග (මූලික වශයෙන්, රෙදි) ආනයන අඩු වීම හේතුවෙන්, වසරකට පෙර පැවති අගයට සාපේක්ෂව අන්තර් භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. 2023 වසරේ පෙබරවාරි මාසයේ දී බොරතෙල් ආනයන වාර්තා නොවූ අතර, තොග එකතු වීම හේතුවෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය කිරීම සැලකිය යුතු ලෙස අඩු විය. රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන පහළ යෑම මගින් (2020 වසරේ මැයි මාසයෙන් පසු අවම අගය) ඉදිරි කාලය තුළ ඇඟලුම් අපනයනවල සිදු විය හැකි පහළ යෑම පෙන්නුම් කරයි. තවද, මූල ලෝහ (ප්‍රධාන වශයෙන්, යකඩ සහ වානේ); රසායනික නිෂ්පාදිත (මූලික වශයෙන්, කාබනික රසායන ද්‍රව්‍ය); ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත (මූලික වශයෙන්, ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික්); රබර් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත (මූලික වශයෙන්, ස්වභාවික සහ කෘත්‍රිම රබර්); සහ රථවාහන සහ යන්ත්‍රෝපකරණ කොටස් ආනයනයේ සැලකිය යුතු පහළ යෑමක් වාර්තා විය. කෙසේ වෙතත්, තිරිඟු; සහ දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.


**ආයෝජන භාණ්ඩ:** යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන ආයෝජන භාණ්ඩ උප කාණ්ඩ තුන යටතේ ආනයන වියදම පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2023 වසරේ පෙබරවාරි මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය.

**රූප සටහන 5: මාසික ආනයන ක්‍රියාකාරීත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: ආනයන සංයුතිය**





**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ දර්ශක

අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2022 වසරේ පෙබරවාරි මාසයට සාපේක්ෂව 2023 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 7.2කින් ඉහළ ගිය අතර, අපනයන මිල ගණන් පහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් පහළ යෑම මේ සඳහා හේතු විය.


**රූප සටහන 7: වෙළඳ මිල අනුපාතය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන ආදායම පහළ යෑම සඳහා අපනයන මිල ගණන් පහළ යෑම වැඩි වශයෙන් දායක වූ හේතු වූ බව නිරූපණය කරමින්, 2023 වසරේ පෙබරවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, අපනයන පරිමා දර්ශකය සහ අපනයන ඒකක මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 2.9කින් සහ සියයට 7.5කින් පහළ ගියේය.


**රූප සටහන 8: අපනයන පරිමා හා ඒකක මිල දර්ශක**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

ආනයන වියදම පහළ යෑම සඳහා ආනයන පරිමා පහළ යෑම සාපේක්ෂව වැඩි වශයෙන් දායක වූ බව පෙන්නුම් කරමින්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන පරිමා දර්ශකය සහ ආනයන ඒකක මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 36.8කින් සහ සියයට 13.7කින් පහළ ගියේය.

**රූප සටහන 9: ආනයන පරිමා සහ ඒකක මිල දර්ශක**





**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## දේශීය ජංගම ගිණුමේ වාර්තා වූ අනෙකුත් ප්‍රධාන වර්ධනයන්

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ:** මෙම වසරේ අඛණ්ඩව දෙවන මාසය සඳහා ද එ.ජ.ඩො. මිලියන 400ක මට්ටම ඉක්මවමින්, 2022 වසරේ පෙබරවාරි මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 205ට සාපේක්ෂව 2023 වසරේ පෙබරවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 407ක් ලෙස වාර්තා විය. මේ අතර, 2023 වසරේ පෙබරවාරි මාසය තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ සමස්තය 23,974ක් ලෙස වාර්තා වූ අතර එය නුපුහුණු (7,662), ගෘහ සේවිකා (6,939) සහ පුහුණු (6,582) යන කාණ්ඩවලින් සමන්විත විය.


**සංචාරක පැමිණීම්:** 2023 වසරේ ජනවාරි මාසයේ වාර්තා වූ 102,545ට සහ 2022 වසරේ පෙබරවාරි මාසයේ වාර්තා වූ 96,507ට සාපේක්ෂව සංචාරක පැමිණීම් ප්‍රමාණය 2023 වසරේ පෙබරවාරි මාසයේ දී 107,639ක් දක්වා ඉහළ ගියේය. 2023 වසරේ පෙබරවාරි මාසය තුළ වැඩිම සංචාරක පැමිණීම් ප්‍රමාණයක් වාර්තා වූ රටවල් ලෙස රුසියාව, ඉන්දියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, සහ ප්‍රංශය පැවතුණි. 2023 වසරේ ජනවාරි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 162ක්[3] සහ පෙර වසරේ පෙබරවාරි මාසය තුළ වූ එ.ජ. ඩොලර් මිලියන 169ට සාපේක්ෂව, 2023 වසරේ පෙබරවාරි මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 170ක්[3] ලෙස ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 11: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 12: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන්:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

[3] තාවකාලික


## මූල්‍ය ලැබීම්

2023 වසරේ පෙබරවාරි මාසය තුළ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත විදේශ ආයෝජනවල සැලකිය යුතු ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, 2023 වසරේ ජනවාරි - පෙබරවාරි දක්වා කාලය තුළ එ.ජ. ඩොලර් මිලියන 30ක සමුච්චිත ශුද්ධ ලැබීමක් වාර්තා විය. මේ අතර, ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව, 2023 වසරේ පෙබරවාරි මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 8ක සහ 2023 වසරේ පෙබරවාරි මාසයෙන් අවසන් වූ මාස දෙක තුළ එ.ජ. ඩොලර් මිලියන 9ක විදේශීය ආයෝජනවල ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

2023 වසරේ පෙබරවාරි මාසය අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 2.2ක් විය. චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.4කට සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීම යම් කොන්දේසි වලට යටත් වේ. මහ බැංකුව 2023 වසරේ පෙබරවාරි මස වෙළඳපළෙන් විදේශ විනිමය ශුද්ධ අවශෝෂණයක් වාර්තා කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2023 වසරේ පෙබරවාරි මාසය අවසන් වන විට ද්‍රවශීලි සංචිතවල සුළු වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි පළමු වාරිකය විශේෂ ගැනුම් හිමිකම් මිලියන 254ක් (එ.ජ. ඩොලර් මිලියන 333ක් පමණ) 2023 වසරේ මාර්තු මාසයේ දී ලැබිණි.

**රූප සටහන 13: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**





**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව


## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

**වර්ධනය වූ වෙළඳපොළ අපේක්ෂාවන් හමුවේ මාර්ගෝපදේශ පරාසයන් සැපයීම සහ අනිවාර්ය විකුණුම් අවශ්‍යතා ඉවත් කිරීමත් සමඟ 2023 වසරේ මාර්තු මාසයේ දී සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය වීමට පෙර, විනිමය අනුපාතිකය 2023 වසරේ පෙබරවාරි මාසය දක්වා අඛණ්ඩව ස්ථාවරව පැවතුණි.** මේ අතර, පරිවර්තනය කරනු ලබන අපනයන ආදායමෙන් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් බලපත්‍රලාභී බැංකු විසින් මහ බැංකුව වෙත විකිණිය යුතු අනිවාර්ය විදේශ විනිමය අවශ්‍යතාව ක්‍රමයෙන් ලිහිල් කිරීමත් ඉන් පසුව ඉවත් කිරීම සහ විනිමය අනුපාතිකය පිළිබඳ දෛනික මාර්ගෝපදේශ සැපයීම අත්හිටු වීමත් සමඟ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතාවයේ වර්ධනයක් නිරීක්ෂණය විය. ඒ අනුව, 2023 වසරේ පෙබරවාරි මස අවසන් වන විට වාර්තා වූ සියයට 0.4ක අතිප්‍රමාණය වීමට සාපේක්ෂව, 2023 වසරේ මාර්තු මස 31වන දින දක්වා කාලය තුළ, ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 10.9ක අතිප්‍රමාණය වීමක් වාර්තා කර ඇත. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් වල හැසිරීම පිළිබිඹු කරමින්, 2023 වසරේ මාර්තු මස 31වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල යුරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන්, ඉන්දියානු රුපියල, සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අතිප්‍රමාණය විය. මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) 2022 වසරේ පෙබරවාරි මාසය තුළ දී සුළු වශයෙන් අතිප්‍රමාණය වූ අතර, ශ්‍රී ලංකා රුපියලෙහි විදේශීය තරඟකාරීත්වයෙහි වර්ධනයක් පෙන්නුම් කරමින් දර්ශක අංක 100යේ සීමාවට වඩා බොහෝ දුරට පහළ මට්ටමක පැවතුණි.

**රූප සටහන 14: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




**රූප සටහන 15: මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකයෙහි වෙනස්වීම**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම***

| මුදල් ඒකකය | 2021 | 2022 | 2023 (මාර්තු 31 දක්වා) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -7.0% | -44.8% | +10.9% |
| යුරෝ | +1.1% | -41.4% | +8.4% |
| ස්ටර්ලින් පවුම | -6.0% | -38.1% | +7.7% |
| ජපන් යෙන් | +3.8% | -36.4% | +11.2% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -1.2% | -40.8% | +11.5% |
| ඉන්දියානු රුපියල | -5.5% | -38.6% | +10.0% |

* අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+)

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**2023 වසරේ මාර්තු මාසය සඳහා වන විදේශීය අංශයේ පුවත්පත් නිවේදනය 2023 වසරේ අප්‍රේල් මස 28වන දින නිකුත් කරනු ඇත.**

**ඇමුණුම I :**

**වෙළඳ අංශයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සාරාංශය (අ)**

| කාණ්ඩය | 2022 පෙබරවාරි එ.ජ.ඩො. මිලියන | 2023 පෙබරවාරි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2022 ජන. - පෙබ. එ.ජ.ඩො. මිලියන | 2023 ජන. - පෙබ. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 1,093 | 982 | -10.2 | 2,196 | 1,960 | -10.7 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,873 | 1,021 | -45.5 | 3,832 | 2,409 | -37.1 |
| වෙළඳ ශේෂය | -780 | -39 | | -1,636 | -449 | |
| සංචාරක ඉපැයීම් | 169 (ආ) | 170 (ඇ) | 0.3 | 321 (ආ) | 332 (ඇ) | 3.3 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 205 | 407 | 98.8 | 464 | 845 | 82.0 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 49 | 8 | | 85 | 9 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 142 | 31 | | 277 | 34 (ඉ) | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | - | 31 | | 5 | 34 | |
| දිගුකාලීන ණය | 142 | ලැ.නො. | | 272 | ලැ.නො. | |
| සමස්ත ශේෂය | | | | -1,697 | 317 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) 2022 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංශෝධනය කරන ලදී.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2023 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.

(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ

(ඉ) දිගු කාලීන ණය සඳහා ඇතුළත් විදේශීය ණය දත්ත 2023 පෙබරවාරි මාසය සඳහා ලැබී නොමැත

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරීත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

**ඇමුණුම II: ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2022 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2023 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2022 ජන. - පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2023 ජන. - පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **885.5** | **777.1** | **-12.2** | **1,777.4** | **1,558.3** | **-12.3** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 50.4 | 41.9 | -16.9 | 92.1 | 76.6 | -16.8 |
| සත්ත්ව ආහාර | 12.0 | 10.6 | -11.1 | 24.8 | 26.8 | 8.1 |
| රෙදිපිළි හා ඇඟලුම් | 496.4 | 431.3 | -13.1 | 1,012.5 | 855.7 | -15.5 |
| එයින්, ඇඟලුම් | 456.7 | 389.5 | -14.7 | 935.6 | 778.4 | -16.8 |
| රෙදිපිළි | 27.7 | 33.1 | 19.5 | 55.4 | 60.5 | 9.1 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 12.0 | 8.8 | -27.1 | 21.5 | 16.8 | -21.6 |
| රබර් නිෂ්පාදිත | 88.3 | 72.7 | -17.7 | 170.3 | 145.4 | -14.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 26.9 | 32.5 | 20.7 | 58.8 | 86.6 | 47.2 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 44.8 | 52.4 | 16.8 | 89.5 | 103.1 | 15.2 |
| ප්‍රවාහන උපකරණ | 11.3 | 8.7 | -23.1 | 20.2 | 14.4 | -28.7 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 56.8 | 44.4 | -21.8 | 124.0 | 90.8 | -26.7 |
| රසායනික නිෂ්පාදිත | 15.5 | 15.7 | 1.7 | 33.3 | 28.4 | -14.7 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 13.0 | 9.9 | -23.4 | 24.7 | 19.7 | -20.3 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 6.9 | 3.4 | -51.5 | 11.1 | 10.9 | -1.7 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.9 | 5.9 | 0.5 | 10.1 | 11.1 | 10.0 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.6 | 5.2 | -21.2 | 12.9 | 9.3 | -27.3 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 17.4 | 14.5 | -16.9 | 31.6 | 24.7 | -21.8 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 3.1 | 2.8 | -9.7 | 5.7 | 5.8 | 2.5 |
| වෙනත් කාර්මික අපනයන | 30.2 | 25.2 | -16.6 | 55.8 | 48.8 | -12.5 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **202.1** | **201.2** | **-0.4** | **406.6** | **392.2** | **-3.5** |
| තේ | 100.9 | 104.6 | 3.7 | 192.1 | 204.1 | 6.3 |
| රබර් | 4.9 | 3.9 | -20.2 | 9.9 | 7.1 | -28.9 |
| පොල් | 34.7 | 25.0 | -27.9 | 68.0 | 47.0 | -30.9 |
| කුළුබඩු | 27.1 | 34.2 | 26.4 | 62.1 | 68.3 | 10.0 |
| එළවළු | 1.6 | 2.1 | 30.1 | 3.9 | 4.5 | 16.1 |
| සකස් නොකළ දුම්කොළ | 2.1 | 2.6 | 24.4 | 4.4 | 3.3 | -23.6 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 9.8 | 8.9 | -9.2 | 21.0 | 16.9 | -19.2 |
| මුහුදු ආහාර | 21.2 | 20.0 | -5.6 | 45.3 | 40.9 | -9.6 |
| **3. ඛනිජ අපනයන** | **4.1** | **1.6** | **-60.9** | **8.4** | **5.2** | **-37.8** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.7** | **2.1** | **24.4** | **3.5** | **4.4** | **25.3** |
| **මුළු අපනයන** | **1,093.3** | **982.0** | **-10.2** | **2,195.9** | **1,960.1** | **-10.7** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇමුණුම III:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)

| කාණ්ඩය | 2022 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2023 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2022 ජන. - පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2023 ජන. - පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **213.2** | **213.2** | **...** | **429.0** | **422.4** | **-1.5** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 24.0 | 22.7 | -5.2 | 51.1 | 46.5 | -9.1 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 5.7 | 5.0 | -11.7 | 11.5 | 10.9 | -4.9 |
| 05 එළවළු හා පලතුරු | 34.4 | 27.7 | -19.5 | 73.5 | 53.3 | -27.4 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 127.8 | 138.6 | 8.4 | 253.6 | 271.8 | 7.2 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **12.3** | **13.3** | **8.1** | **21.0** | **22.9** | **8.7** |
| 11 පාන වර්ග | 3.4 | 5.2 | 53.1 | 5.8 | 9.2 | 59.6 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 8.9 | 8.1 | -9.0 | 15.3 | 13.6 | -10.5 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **42.3** | **32.0** | **-24.4** | **80.4** | **64.4** | **-19.9** |
| 23 සකස් නොකළ රබර් | 5.0 | 4.0 | -20.3 | 10.2 | 7.3 | -28.4 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 22.9 | 16.7 | -27.1 | 41.6 | 33.9 | -18.6 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **56.8** | **44.4** | **-21.8** | **124.0** | **90.8** | **-26.7** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 56.8 | 44.4 | -21.8 | 108.1 | 90.8 | -16.0 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | - | - | - | 15.9 | - | - |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **9.1** | **5.9** | **-35.4** | **16.0** | **9.9** | **-38.1** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 5.3 | 5.9 | 11.0 | 10.9 | 9.7 | -10.3 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **19.4** | **19.3** | **-0.5** | **40.2** | **35.1** | **-12.6** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **152.6** | **150.9** | **-1.1** | **298.3** | **306.1** | **2.6** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 61.0 | 57.7 | -5.3 | 114.8 | 109.7 | -4.4 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 36.7 | 37.3 | 1.5 | 72.9 | 67.6 | -7.4 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 31.7 | 37.0 | 16.8 | 67.7 | 95.3 | 40.6 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **54.7** | **59.2** | **8.3** | **106.9** | **114.5** | **7.1** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 28.2 | 32.5 | 15.3 | 55.6 | 63.3 | 13.9 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **532.9** | **443.7** | **-16.7** | **1,080.2** | **893.9** | **-17.2** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 486.7 | 408.2 | -16.1 | 997.4 | 820.9 | -17.7 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | - | ... | - | ... | ... | - |
| **මුළු අපනයන** | **1,093.3** | **982.0** | **-10.2** | **2,195.9** | **1,960.1** | **-10.7** |

(අ) තාවකාලික

... සැලකිය යුතු නොවේ

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

**ඇමුණුම IV:**

## ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2022 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2023 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2022 ජන. - පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2023 ජන. - පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **298.8** | **202.2** | **-32.3** | **658.8** | **420.7** | **-36.1** |
| ආහාර හා පාන වර්ග | 161.4 | 114.8 | -28.9 | 348.6 | 233.1 | -33.1 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 41.7 | 14.0 | -66.4 | 102.2 | 29.3 | -71.4 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 23.6 | 13.1 | -44.4 | 53.5 | 29.3 | -45.2 |
| එළවළු (ආ) | 33.0 | 20.0 | -39.3 | 62.6 | 44.1 | -29.5 |
| මුහුදු ආහාර | 8.1 | 3.4 | -57.4 | 16.5 | 7.0 | -57.4 |
| සීනි හා රසකැවිලි | 17.7 | 35.1 | 97.7 | 43.8 | 67.9 | 55.0 |
| කුළුබඩු | 15.0 | 12.6 | -15.5 | 26.9 | 22.6 | -16.0 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 22.4 | 16.5 | -26.3 | 43.2 | 32.9 | -23.8 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 137.3 | 87.5 | -36.3 | 310.2 | 187.6 | -39.5 |
| පෞද්ගලික රථවාහන | 0.7 | 3.1 | 361.2 | 1.4 | 4.7 | 240.0 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 44.5 | 42.0 | -5.7 | 123.4 | 93.0 | -24.7 |
| ගෘහ උපකරණ | 17.8 | 3.0 | -83.1 | 34.1 | 7.3 | -78.7 |
| රෙදිපිළි හා උපාංග | 25.7 | 13.9 | -45.8 | 48.6 | 32.2 | -33.8 |
| විදුලි සංදේශ උපකරණ | 8.6 | 4.0 | -53.7 | 25.3 | 7.6 | -69.9 |
| ගෘහ හා දැව භාණ්ඩ | 20.7 | 8.3 | -59.9 | 36.0 | 15.3 | -57.6 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 19.4 | 13.2 | -32.1 | 41.4 | 27.7 | -33.1 |
| **2. අන්තර් භාණ්ඩ** | **1,219.8** | **637.7** | **-47.7** | **2,432.3** | **1,608.2** | **-33.9** |
| ඉන්ධන | 462.2 | 204.3 | -55.8 | 892.5 | 685.4 | -23.2 |
| එයින්, බොරතෙල් (ඇ) | 51.6 | - | - | 110.1 | 107.6 | -2.3 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 338.8 | 152.1 | -55.1 | 650.0 | 439.2 | -32.4 |
| ගල්අඟුරු | 71.8 | 52.2 | -27.3 | 132.4 | 138.6 | 4.7 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 12.5 | 21.2 | 70.1 | 26.5 | 42.4 | 60.2 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 323.1 | 166.0 | -48.6 | 639.7 | 383.4 | -40.1 |
| කඩදාසි හා ඝන කඩදාසි | 40.3 | 36.8 | -8.6 | 81.6 | 73.8 | -9.5 |
| කෘෂිකාර්මික යෙදවුම් | 18.1 | 21.0 | 16.0 | 35.0 | 43.3 | 23.5 |
| තිරිඟු හා ඉරිඟු | 15.8 | 34.0 | 114.9 | 57.5 | 39.6 | -31.2 |
| මූල ලෝහ | 71.5 | 14.2 | -80.1 | 146.4 | 27.3 | -81.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 66.8 | 29.1 | -56.5 | 143.9 | 66.5 | -53.8 |
| රසායනික නිෂ්පාදිත | 92.4 | 54.2 | -41.3 | 179.2 | 114.7 | -36.0 |
| පොහොර | 4.2 | 5.8 | 39.2 | 6.7 | 15.4 | 131.2 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 33.4 | 11.3 | -66.2 | 67.2 | 25.5 | -62.0 |
| ඛනිජ නිෂ්පාදිත | 12.4 | 7.3 | -41.4 | 29.0 | 12.9 | -55.5 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 67.2 | 32.6 | -51.5 | 127.2 | 78.0 | -38.7 |
| **3. ආයෝජන භාණ්ඩ** | **353.6** | **180.9** | **-48.9** | **740.3** | **379.7** | **-48.7** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 224.3 | 127.2 | -43.3 | 468.1 | 259.8 | -44.5 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 115.5 | 48.8 | -57.7 | 239.5 | 112.0 | -53.2 |
| ප්‍රවාහන උපකරණ | 13.1 | 4.6 | -65.3 | 31.8 | 7.3 | -77.1 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.7 | 0.3 | -64.3 | 1.0 | 0.6 | -35.2 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.8** | **0.2** | **-68.0** | **0.9** | **0.4** | **-58.4** |
| **මුළු ආනයන** | **1,872.9** | **1,021.0** | **-45.5** | **3,832.3** | **2,409.0** | **-37.1** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,410.8** | **816.8** | **-42.1** | **2,939.9** | **1,723.6** | **-41.4** |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දත්ත නොලැබීම හේතුවෙන් බොරතෙල් අගයන් රේගු දත්ත මත පදනම් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකු

**ඇමුණුම V:**

## සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | 2022 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | 2023 පෙබරවාරි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2022 ජන. - පෙබ. (එ.ජ.ඩො. මිලියන) | 2023 ජන. - පෙබ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **195.6** | **168.2** | **-14.0** | **444.3** | **313.4** | **-29.4** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 23.6 | 13.1 | -44.3 | 53.5 | 29.3 | -45.2 |
| | | | | | | |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 8.2 | 3.6 | -56.1 | 16.8 | 7.3 | -56.7 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 57.0 | 48.5 | -14.9 | 159.0 | 69.1 | -56.5 |
| 05 එළවළු හා පලතුරු | 40.1 | 23.8 | -40.7 | 76.5 | 50.9 | -33.5 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 17.7 | 35.1 | 97.7 | 43.8 | 67.9 | 55.0 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 19.3 | 16.8 | -12.6 | 35.8 | 30.2 | -15.5 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **9.5** | **5.1** | **-46.5** | **17.3** | **16.7** | **-3.4** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **46.6** | **18.2** | **-60.9** | **95.7** | **44.0** | **-54.0** |
| 23 සකස් නොකළ රබර් | 27.8 | 8.1 | -70.8 | 56.0 | 18.4 | -67.2 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 3.5 | 3.5 | 0.1 | 5.3 | 7.4 | 38.3 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **462.2** | **204.3** | **-55.8** | **892.5** | **685.4** | **-23.2** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 375.9 | 135.9 | -63.9 | 713.4 | 496.7 | -30.4 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 14.4 | 16.2 | 12.4 | 46.7 | 50.0 | 7.1 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **9.2** | **6.3** | **-32.0** | **17.1** | **11.2** | **-34.2** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 7.4 | 5.3 | -27.6 | 13.1 | 9.4 | -28.4 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **206.9** | **128.2** | **-38.1** | **453.8** | **283.8** | **-37.5** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 41.0 | 39.1 | -4.7 | 116.4 | 86.6 | -25.6 |
| 56 පොහොර | 4.2 | 5.8 | 39.2 | 6.7 | 15.4 | 131.3 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 47.6 | 18.7 | -60.7 | 105.1 | 40.4 | -61.6 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 17.0 | 7.8 | -54.2 | 35.8 | 21.2 | -40.8 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **583.0** | **299.9** | **-48.6** | **1,170.5** | **655.5** | **-44.0** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 38.9 | 35.6 | -8.5 | 76.4 | 71.8 | -6.0 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 318.8 | 161.0 | -49.5 | 627.3 | 370.0 | -41.0 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 48.6 | 40.3 | -17.2 | 103.6 | 79.0 | -23.8 |
| 67 යකඩ හා වානේ | 96.5 | 16.1 | -83.3 | 192.8 | 38.4 | -80.1 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **272.8** | **141.4** | **-48.2** | **567.2** | **287.3** | **-49.3** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 56.2 | 15.7 | -72.1 | 112.8 | 34.6 | -69.3 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 58.7 | 28.8 | -51.0 | 104.8 | 56.5 | -46.1 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 20.5 | 9.1 | -55.8 | 49.6 | 19.9 | -59.8 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 27.2 | 10.0 | -63.1 | 65.8 | 23.2 | -64.8 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 72.2 | 41.8 | -42.1 | 134.4 | 84.3 | -37.3 |
| 78 රථවාහන | 17.2 | 10.2 | -40.8 | 38.1 | 19.8 | -48.2 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **86.6** | **49.2** | **-43.2** | **173.1** | **111.1** | **-35.8** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 21.5 | 12.8 | -40.5 | 40.9 | 29.3 | -28.3 |
| 87 වෘත්තීමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 17.4 | 9.1 | -47.6 | 33.1 | 19.7 | -40.4 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.7** | **0.3** | **-47.1** | **1.0** | **0.6** | **-38.7** |
| **මුළු ආනයන** | **1,872.9** | **1,021.0** | **-45.5** | **3,832.3** | **2,409.0** | **-37.1** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf